# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2272/40 - 2022 මාර්තු මස 23 වැනි බදාදා - 2022.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ තරුණ හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**නාමල් රාජපක්ෂ,**
තරුණ හා ක්‍රීඩා අමාත්‍ය.

2022 මාර්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2020 දෙසැම්බර් මස 23 වැනි දින අංක 2207/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් අවසාන වරට සංශෝධනය කරනු ලැබුවා වූ, 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

01. එහි 8(1) (අ) නියෝගය

ලියාපදිංචි කරන ලද ජාතික ක්‍රීඩා සංගමයක යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් සහ ජාතික ක්‍රීඩා සංගමයක් විසින් පත්කරන ලද නිලවරණ කමිටුව ඇතුළුව අනෙකුත් කමිටුවක තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් එම තීරණය හෝ ක්‍රියාව ලැබීමෙන් දින හතක් ඇතුලත ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා වෙත ලිඛිතව අභියාචනා කරනු ලැබිය හැකිය.

02. 8(1)(ආ) නියෝගය

එකී අභියාචනය සනාථ කිරීම සඳහා අදාළ සියලු සාක්ෂි හා අනෙකුත් අවශ්‍ය කරුණු ද විෂය භාර අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවන ලද ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හයදහසක (රු.6000/-) ආපසු නොගෙවනු ලබන මුදල (ක්‍රීඩකයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන අභියාචනා හැර) ගෙවූ බවට වන ලදු පතේ මුල් පිටපත ද එම අභියාචනය සමග විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත පිටපතක් සහිතව ඉදිරිපත් කළ යුතු ය.

03. 8(3)(ආ) නියෝගය

(මෙහි මින්මතු 'කමිටුව' යනුවෙන් හඳුන්වනු ලබන) අභියාචනා උපදේශක කමිටුව, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයකුගෙන්, නීති ක්ෂේත්‍රයේ පුළුල් දැනුමක් සහ අත්දැකීමක් ඇති තැනැත්තන්ගෙන් සහ ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනය සඳහා දායකත්වය ලබා දී ඇති තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

04. 8(3)(ඇ) නියෝගය

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයා කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී සාමාජිකයන් විසින් රැස්වීමේ මුලසුන දැරීම සඳහා සාමාජිකයකු තෝරා පත්කර ගත යුතු ය.

EOG 3 - 0992

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.